# කුවේණිලා හා විභීෂණලා

ගැලීලියෝ විද්වතා රික්තයක් නිර්මාණය නොකර රික්තයක සිදුවන චලිතය නිරීක්ෂණය නොකර ම එවැනි චලිතයක් විශ්ලේෂණය කෙළේ කෙසේ ද යන්න පිළිබඳ ව අපි තරමක් දුරට සාකච්ඡා කෙළෙමු. ඒ සම්බන්ධ අනෙක් ප්‍රශ්නය වූයේ ඔහුට රික්තයක් නිර්මාණය නොකර ඒ පිළිබඳ ව අනෙක් අයට ඒත්තු ගැන්විය හැකි වූයේ කෙසේ ද යන්න ය. එය දේශපාලන සංස්කෘතික ප්‍රශ්නයකි. මේ කාලය වන විට යුරෝපය, විශේෂයෙන් ම බටහිර යුරෝපය නව චින්තනයක් නිර්මාණය කරමින් සිටියේ ය. දේශපාලනික වශයෙන් හා සංස්කෘතික වශයෙන් රෝම අධිරාජ්‍යයේ හා පාප් වහන්සේගේ බලය හීන වෙමින් පැවතියේ ය. ජාතික රාජ්‍ය සඳහා ඉල්ලුමක් තිබුණේ ය. ලෝකය දැකීමේ ක්‍රමයේ වෙනසක් යුරෝපය ඉල්ලා සිටියේ ය. මේ යුරෝපය, එනම් බටහිර යුරෝපය, යනු අන් කිසිවක් හෝ අන් කවරකුවත් නොව බටහිර යුරෝපයේ ජනතාව ය. විශේෂයෙන් ම එහි වෙනසක් ඉල්ලා සිටි ජනතාව ය.

මේ ජනතාවට ගැලීලියෝ පඬිවරයා ද අයත් බව අමතක නොකළ යුතු ය. වෙනසක් ඉල්ලා සිටින ජනතාවකට ඒ වෙනස පිළිබඳ ව ද යම් අදහසක් තිබෙන බව අමතක නොකළ යුතු ය. එහෙත් ඒ වෙනස යම්කිසි තරමකට හෝ පැහැදිලි ව, හැකි පමණ විසංවාදයෙන් තොරව, සූත්‍රගත කර ක්‍රමවත්ව ඉතිරිපත් කළ හැක්කේ සමාජයක කිහිප දෙනකුට පමණකි. ඉන් එක් අයකු හෝ කිහිප දෙනකු හෝ එලෙස එය සූත්‍රගත කර ඉදිරිපත් කළ විට අනෙක් අය එය වැළඳ ගන්නේ ඉඩෝරයකට පසුව ලැබෙන වැස්ස උරාගන්නා කර්කශ පොළොව මෙනි. මේ සම්බන්ධ විස්තර විටින් විට කලින් ද ඉදිරිපත් කෙරී ඇත. ගැලීලියෝ පඬිවරයා මෙන් ම එකල ජීවත් වූ යම් පිරිසකට ඒ වෙනස අවශ්‍ය වී තිබිණි. වෙනසක් අවශ්‍ය ව සිටි පිරිස ඒ අදහස් ඉක්මණින් ම පිළිගන්නවා පමණක් නොවේ. ඔවුහු වැඩිකල් නොගොස් ම නව සමාජයේ බුද්ධිමතුන් බවට පත්වෙති. නව සමාජයට අවශ්‍ය කරුණු කාරණා තේරුම් ගත හැක්කේ මේ පිරිසට ය. ඔවුහු නව සමාජයේ බුද්ධිමය ආධිපත්‍යය ද දරති. ගැලීලියෝ විද්වතාට රික්තයක් නිර්මාණය නොකර ම රික්තයක සිදුවන චලිතය ගැන බටහිර යුරෝපයේ අනෙක් අයට ද ඒත්තු ගැන්වීමට හැකිවූයේ ඔවුන් ඒ පිළිගැනීම සඳහා සූදානමින් සිටි බැවිනි.

රටක් යටත්විජිතයක් බවට පත්වීමේ දී, සමාජයක සිදුවන්නේ මෙයට වෙනස් ක්‍රියාවලියකි. එහි දී යටත්විජිතවාදියා තමන් යටත් කරගත් හෝ යටත් කර ගැනීමට බලාපොරොත්තුවන රටෙන් යම් පිරිසක් තමන් වෙනුවෙන් සේවය සඳහා යොදා ගනියි. මේ පිරිස වෙනසක් අවශ්‍ය පිරිසක් වුවත් ඔවුන්ට අවශ්‍ය වන්නේ රටට අවශ්‍ය වූ වෙනසක් නොවේ. නව සමාජයේ ඉහළ යැයි සැළකෙන තනතුරු ලබා ගැනීමේ හා යම් ප්‍රභූ තත්ත්වයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය හැරෙන්නට වෙනත් අවශ්‍යතාවයක් ඔවුන්ට නැත. එහෙත් එවැන්නෝ ද බොහෝ සමාජවල දක්නට ලැබෙති. මේ අය යටත්විජිතවාදියාගේ අදහස් රට තුළ ප්‍රචාරය කරති. රටේ බහුතරයට ඒ අවශ්‍ය නොවුව ද තුවක්කුවේ, කඩුවේ ආධාරයෙන් හා වෙනත් උපක්‍රම මගින් තම අවශ්‍යතාවය යටත්විජිතවාදියා ඉටු කර ගනියි. රටට අවශ්‍ය වෙනස මේ යැයි පෙන්වා දෙන පිරිස නැතහොත් යටත්විජිතවාදියාට අවශ්‍ය වෙනස රටට අවශ්‍ය නැතැයි පෙන්වා දෙන්නන්ට එවැනි රටක පිළිගැනීමක් නොලැබෙයි. යම් පිළිගැනීමක් තිබුණි නම් ඒ ක්‍රමයෙන් දිය වී යාමට සලස්වනු ලැබේ. පිළිගැනීම හා ප්‍රභූත්වය ලැබෙන්නේ යටත්විජිතවාදියාට අවශ්‍ය වෙනස වෙනුවෙන් ඉදිරිපත් වන්නන්නට ය. මෙවැනි පිරිස් ගැන විභීෂණ යුගයේ සිටම අසන්නට ලැබෙයි. වෙනත් පිරිසකට සවන් දීමේ සූදානමක් යටත්විජිතවාදයට ගොදුරු වූ සමාජයක වේ නම් ඉන් කියැවෙන්නේ ඒ සමාජය ද යටත්විජිතවාදයට අවශ්‍ය නැති වෙනසකට සූදානමින් සිටින බව ය.

විභීෂණ කතාවේ තේරුම කුමක් ද? රාම රාවණ යුද්ධය ලංකාවේ සිදුවිණි ද නැත් ද යන්න මෙහි දී ප්‍රශ්නයක් නොවේ. මට අවශ්‍ය විභීෂණ සංකල්පය තේරුම් කර දීම පමණ ය. භීෂණ යන වචනය ඉදිරියෙන් වි නම් උපසර්ගය යෙදුණු විට එය භීෂණ යන්නට විරුද්ධ තේරුම ගත හැකි ය. එසේත් නැත්නම් වැඩි භීෂණය යන්න ද එහි අරුත විය හැකි ය. රාම රාවණ කතාවේ සඳහන් විභීෂණ භීෂණයට හා යුද්ධයට විරුද්ධ විය. එබැවින් විභීෂණ යන්නෙහි තේරුම භීෂණයෙන් තොර යන්න ලෙස ගත හැකි ය. මේ විභීෂණ යන්න ඔහුට දෙමව්පියන් දුන් නම යැයි මම නොසිතමි. විජය රජුගේ නම ද එලෙස ම සිංහබාහු රජු (ඔහු ඇත්තට ම විජය රජුගේ පියා නම්) හා සිංහ සීවලී රැජන (ඇය විජයගේ මව නම්) ඒ කුමරුට දුන් නමක් නොවේ යැයි සිතමි. මේ නම ඔහුට දෙන්නට ඇත්තේ ඒ කුමරු සමග මෙරටට

© Prof. Nalin De Silva

උත්තර භාරතයෙන් පැමිණි බමුණන් විය යුතු ය. මෙරට සිටි යක්ෂ ගෝත්‍රිකයන් තීරණාත්මක සටනකින් පරාජය කර ජයගත් කුමරුට විජය යන නම පසු කලෙක බමුණන් දෙන්නට ඇත. ජය යන්න ඉදිරියෙන් වි යෙදූ විට මෙහි දී ජය වඩාත් තීව්‍ර වෙයි. කුවේණිය හෙවත් කුවණ්නා යනු ද එලෙසින් බමුණන් දුන් නමකි. කුවණ්නා යන්නෙහි තේරුම නරක වර්ණය යනුයි. භාරතයට බටහිරින් පැමිණි ආර්යයෝ සුදු පැහැයෙන් යුක්ත වූහ. ඔවුහු භාරතයේ එවකට විසූ දුඹුරු පැහැයෙන් හා කහ පැහැයෙන්  යුක්ත ජනතාව පහත් කොට සැළකූහ. බමුණෝ වර්ණ භේදය ආරම්භ කර භාරතයේ විසුවන් පැගීමේ ක්‍රියා දාමය ආරම්භ කළහ.

ලංකාවට ද පැමිණි බමුණන් ද මෙරට වැසියන්ට අවඥාවෙන් සැලකීමට හා ඇමතීමට පටන් ගත්තාට සැකයක් නැත. කුවේණිය බමුණන්ට අනුව නරක වර්ණයක් එනම් කළු හෝ දුඹුරු පැහැයක් ඇති තරුණියක් වූවා ය. ලංකාවේ විසූ කළු හෝ දුඹුරු තරුණිය භාරතයෙන් පැමිණි බමුණන්ට කුවේණිය වූවා ය. කෙසේ වෙතත් කුවේණිය මෙන් ම විභීෂණ ද යටත්විජිතවාදීන්ගේ අවශ්‍යතා අනුව ක්‍රියා කළ තැනැත්තෙක් විය. කුවේණිය විජය ගැන පිළිබඳ සිතක් ඇති කරගෙන තම වර්ගයා පාවා දීමට කටයුතු කළා ය. තම ඥාතීන් වූ යක්ෂයන් මරා දමා විජයට රජකම අරන් දී ඈ බලාපොරොත්තු වුයේ රජ සැප ම යැයි කිව නොහැක්කේ ඇය යක්ෂ කුමාරිකාවක් වූ බැවිනි. විජයගේ හැඩි දැඩි දේහයට ඇය ලොල් වූවා විය හැකි ය. කිනම් කරුණක් නිසා හෝ තම පෞද්ගලික අභිමතාර්ථයක් ඉටු කර ගැනීම සඳහා ඇය තම ගෝත්‍රයට හා රටට ද්‍රෝහි වූවා ය. එහෙත් බමුණෝ ඇයට කෙළෙහි ගුණ නොසැලකූහ. ඔවහු යථා කාලයේ දී ඇය පන්නා දමා විජය රජුට පඬිරටින් මෙහෙසියක ගෙන්වා ගැනීමට කටයුතු කළහ. කුවේණිය කළ පාවා දීමට ඇයට ඇගේ ගෝත්‍රික යක්ෂයකුගෙන් දඬුවම ලැබිණි. ඥාති යක්ෂයෙක් ඇය මරා දැමී ය. අද කුවේණිගේ පරම්පරාවක් බිහි වී ඇති බව පෝස්ටර මගින් දැන ගැනීමට ලැබී ඇත. මේ නම නම් මේ පරම්පරාවට අන්වර්ථ නාමයක් බව පැහැදිලි ය. කුවේණිගේ පරපුර යනු අද දවසේ නම් බටහිර සංස්කෘතික යටත්විජිතවාදීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් හා තම පෞද්ගලික ආශාවන් වෙනුවෙන් ජාතිය පාවා දීමට බිහි වී ඇති ගැහැණුන්ගේ පරපුර ය. ඔවුන් ම ඒ නම තෝරා ගැනීම කෙතරම් අපූරු ක්‍රියාවක් ද?

විභීෂණ යනු එකල යුද්ධයට විරුද්ධ වූ තැනැත්තා විය. ඔහු රාවණ රජුගේ සොහොයුරකු යැයි කියැවෙයි. රාම රජු නම් ආක්‍රමණිකයා විභීෂණ තම පැත්තට නම්මා ගත්තේ ය. ඔහුගේ ඊනියා යුද විරෝධී ස්ථාවරයෙන් සිදු වූයේ රාම රාවණ පරදවා ජය ගැනීම මිස යුද්ධය නතර වීම නොවේ. ඔහුගේ ඊනියා යුද විරෝධය නිසා ම රාමගේ බමුණන් ඔහුට විභීෂණ යයි නම් තබන්නට ඇත. අද ද මෙරට විභීෂණලා වෙති. ඔවුහු ද ඊනියා යුද විරෝධීහු වෙති. ඒ ඊනියා යුද විරෝධී කමින් ඔවුන් සේවය කරන්නේ බටහිර යටත්විජිතවාදීන්ට ය. විභීෂණලා හා කුවේණිලා යනු රටට අවශ්‍ය වෙනසක් පතන්නෝ නොවෙති. ඔවුන්ට අවශ්‍ය යටත්විජිතවාදයට අවශ්‍ය වෙනස ය. අද අප රටට අවශ්‍ය තවත් කුවේණිගේ පරම්පරාවක් නොවේ. ගැලීලියෝ විද්වතාණන්ගේ කාලයේ ඉතාලිය ඇතුළු බටහිර යුරෝපයේ වෙනසක් අපේක්ෂා කළෝ විභීෂණලා හා කුවේණිලා නොවූහ.

ගැලීලියෝ විද්වතා හඳුන්වා දුන් ඊනියා පරයේෂණාත්මක ක්‍රමයක් නැති වුවත්, ඔහු බටහිර චින්තනය වෙනත් මගකට ඇද දැමීමෙහි ලා පුරෝගාමී මෙහෙයක් ඉටු කෙළේ ය. නූතනත්වය සමග ඇති වූ ඒ චින්තන විප්ලවය වැදගත් බව සැබෑ ය. බටහිරයන් අද බටහිර විද්‍යාව හා තාක්ෂණය වර්ධනය කරගෙන ඇත්තේ මේ නව චින්තනයට පින් සිදු වන්නට ය. එහෙත් එය චින්තන පෙරළියක් ලෙස නොව ඊනියා විධි ක්‍රම වෙනසක් ලෙස පෙන්වීම වැරදිය. බටහිරයන් අප පාලනය කරන්නේ මුළුමනින් ම මෙන් බටහිර විද්‍යාව හා බටහිර තාක්ෂණය ආධාර කරගෙන බැවින් මේ චින්තන පෙරළිය අප තව දුරටත් හොඳින් අවබෝධ කරගත යුතු ය.

ඒ ඒ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කල පොදු ගුණ ඇති දෑ, ඒවා අතර වෙනසක් නොකර එකට හැදෑරීම බටහිර චින්තනයෙහි අංගයකි. සාධාරණීකරණය (ජෙනරලයිසේෂන්) හෙවත් සාමාන්‍යකරණය නමින් බටහිරයෝ මෙය හඳුන්වති. සාමාන්‍යකරණය සඳහා වියුක්තකරණයක් අවශ්‍ය වෙයි. මිනිසා නමින් හැඳින්වෙන පොදු මිනිසා දැනගත හැක්කේ අසවල් අසවල් මිනිසුන් ගැන සංයුක්තව සිතීමෙන් නොවේ. ඕනෑම මිනිසකු ළඟ ඇති ගුණ කවරේදැයි දැන ගෙන ඒ අනුව වියුක්ත මිනිසා නිර්මාණය කෙරෙයි. එසේත් නැත්නම් ගොවියා හෝ සිංහලයා හෝ ආදී වශයෙන් ගොවීන් සියළු දෙනාගේ පොදු ගුණ රැගත් අයකු ගැන හා සිංහල මිනිසුන්ගේ පොදු ගුණ ඇති අයකු අපට නිර්මාණය කර ගත හැකි ය.

© Prof. Nalin De Silva

මේ වර්ගීකරණයක් යැයි නොසිතිය යුතු ය. වර්ගීකරණයක දී එකම වර්ගයකට අයත් දෑ හඳුනා ගැනෙයි. පළතුරුවලින් කෙසෙල් නම් වර්ගය වෙන්කර ගැනීමට අපි දනිමු. ඒ කෙසෙල්වලිනුත් ආනමාලු, ඇඹුල්, කෝලිකුට්ටු ආදී වශයෙන් විවිධ කෙසෙල් වර්ග හඳුනාගැනීමට අපට හැකි ය. වර්ගීකරණය බටහිරයන්ට පමණක් නොව සියල්ලන්ට ම පොදු වූ ගුණයකි. සියළු ගෝත්‍රවල, ජාතිවල මිනිස්සු වර්ගීකරණයෙහි යෙදෙති. වර්ගීකරණයක් යනු වියුක්තකරණයක් නොවේ. ආනමාලු නම් කෙසෙල් වර්ගය අපට ඇඹුල් නම් කෙසෙල් වර්ගයෙන් වෙන්කර හඳුනාගැනීමට හැකි ය. ඒ සඳහා අවශ්‍ය වන්නේ සංයුක්ත ඉන්ද්‍රිය ගෝචර දැනුමකි. ආනමාලු ගෙඩියක දිග, හැඩය, රස ආදිය පංචේන්ද්‍රියන්ට ගෝචර වෙයි. ඇඹුල් කෙසෙල් ගෙඩියක් සම්බන්ධයෙන් ද එසේම ය. කෙසෙල්ගෙඩි ඇඹුල්, ආනමාලු ආදී වශයෙන් වෙන් කිරීම වර්ගීකරණයකි.

එහෙත් සාධාරණීකරණයක් හෝ පොදුකරණයක් යනු එවැන්නක් නොවේ. වර්ගීකරණය සංයුක්ත වන අතර සාධාරණීකරණය වියුක්ත වෙයි. වියුක්ත මිනිසා යනු අපට පංචේන්ද්‍රිය ආධාරයෙන් දැනගත හැකි දෙයක් නොවේ. අප දන්නේ ඒ ඒ මිනිසුන් මිස මිනිසා නොවේ. මිනිසුන් වෙනත් සතුන්ගෙන් වෙන්කර ගැනීම වර්ගීකරණයක් නොවේදැයි කිසිවකුට ඇසිය හැකි ය. මිනිසුන්ගේ කුලකය අපට වලසුන්ගේ හෝ රාජාලියන්ගේ හෝ කුලකයෙන් වෙන්කර ගත හැකි ය. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැත. සාධාරණීකරණයක වර්ගීකරණයක් ද වෙයි. එහෙත් වර්ගීකරණයක නැති දෙයක් සාධාරණීකරණයක වෙයි. ඒ වියුක්තයයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva